1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.03 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.01.02 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.12.16 වැනි දින පස්වරු 2.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ වැහැර පිහිටි වැහැරවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සකසන ලද 1992.12.08 දිනැති හා අංක 160/92 දරන පිඹුරේ කැබලි අංක 3 සහ 4 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 12 ක සහ අ. 0 රූ. 0 පර්. 12.25 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස් සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

තවද එකී 160/92 හි සඳහන් ප්‍රකාර බෙදා වෙන් කරන ලද මාර්ග අයිතීන් ද සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ 1516/68,69 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ, අංක 269.

11-246/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/72153/වයි18/921.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.02.11 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.04 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.12.16 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණුවල පිහිටි වැවේවත්ත නම් වූ ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් සකසන ලද 2000.03.16 දිනැති හා අංක 1280 දරන පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 23.44ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ කැබලි අංක 3 මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ 1440/69, 70 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ, අංක 269.

11-246/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 3/65518/ඩී3/845.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.08.09 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.05.05 වැනිදා ලංකාදීප පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.12.16 වැනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අළුත්ගම කෝරළේ, නැගෙනහිර මුරුත්තෙට්ටුව ග්‍රාමසේවක බල ප්‍රදේශයේ පිහිටි ග්ලාසල්වත්ත නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයාගේ 1981.08.07 දින හා අංක කෑ. 1747 දරන පිඹුරේ කැබලි අංක 31 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 2 පර්. 4.21 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග සහ එකී පිඹුරේ පෙන්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක කිව් 19/42 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2006 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ, අංක 269.

11-246/5

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2503300085.
ණයකරුගේ සම්පූර්ණ නම : වරාපිටිගේ ලාල් කුමාර රත්නසිරි

(මෙහි මින් මතු "එකී පනත " යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.07.25 වැනි දින අංක 1299 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.09.28 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්",සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, කුරුණෑගල, කුමාරතුංග මාවත, නව කාර්යාල සංකීර්ණය, අංක 28 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. අයි. එම්. ගල්ලැල්ල මහතා විසින් 2006.11.28

වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූතුන්දහස් අටසිය දහනවයයි ශත පනස්තුනක (රු. 93,819.53) මුදලක් වර්ෂ 2002.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටපන්දහස් දෙසිය හැත්තෑවයි ශත තිස් එකක (රු. 65,270.31) මුදල ද, 2002.12.31වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඅටදහස් පන්සිය හතලිස් නවයයි ශත විසදෙකක්(රු. 28,549.22) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූතුන්දහස් අටසිය දහනවයයි ශත පනස් තුනක් (රු. 93,819.53) ද,

(2) එකී රුපියල් හැටපන්දහස් දෙසිය හැත්තෑවයි ශත තිස්එකක් (රු. 65,270.31) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2003.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහාද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, තීරවේලි පත්තුවේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාහේන හි පිහිටි 'තුන්ගොඩැල්ලහේන දැන් වත්ත' නමැති ඉඩම 1977.12.06 දින වී. එන්. කාදර් විසින් මැන සාදන ලද අංක 3031 දරන පිඹුර ප්‍රකාර අංක 3 දරන කැබැල්ලට මායිම්, උතුරට : කැබලි අංක 2 ද, නැගෙනහිරට : අඩි හයක් පළල පාර, දකුණට : කැබලි අංක 4 ද, බටහිරට : ඇල සහ කුඹුර ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයක (අ. 0 රූ. 0 පර්. 36) වපසරියකින් යුතු වූ ඉඩම මීට අයත් මාර්ග පරවශතාවයන් ද සමග වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 990/199 හි ලියාපදිංචි කරන ලදී.

ඉහත සඳහන් මාහේන ග්‍රාමයේ පිහිටි "තුන්ගොඩැල්ලහේන දැන් වත්ත" නැමැති ඉඩමේ අංක 4 දරන කැබැල්ලට මායිම්, උතුරට කැබලි අංක 3 ද, නැගෙනහිරට අඩි 6 පළල පාරක් ද, දකුණට අඩි 5ක් පළල පාරක් ද, බටහිරට ඇල ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතක (අක්. 0 රූ. 0 පර්. 37) වපසරියකින් යුතු වූ ඉඩම මීට අයත් මාර්ග පරවශතාවයන් සමග වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 990/200 හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-240

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000584.
ණයකරුගේ සම්පූර්ණ නම : වේලු මන්සූලා

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.01.07 වැනි දින අංක 1375 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.01.08 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මහනුවර, වටපුළුව, බෝමළුව පාර, අංක 83/5 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මහතා විසින් 2006.11.28 වැනි දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්පන්දහස් හාරසිය හතලිස් හතයි ශත අසූපහක (රු. 55,447.85) මුදලක් වර්ෂ 2002.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතලිස් එක්දහස් පන්සිය අසූදෙකයි හතලිහක (රු. 41,582.40) මුදල ද, 2002.10.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහතුන්දහස් අටසිය හැට පහයි ශත හතලිස් පහ (රු. 13,865.45) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස් පන්දහස් හාරසිය හතලිස් හතයි ශත අසූපහ (රු.55,447.85) ද,

(2) එකී රුපියල් හතලිස් එක්දහස් පන්සිය අසූදෙකයි ශත හතලිහක (රු. 41,582.40) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.40% බැගින් වන පොලියක් 2002.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ අස්ගිරි පල්ලේසිය පත්තුවේ, කවුඩුපැලැල්ල ග්‍රාමයේ පිහිටි කන්දවත්ත කොට්ඨාසයේ, මහලෙවකන්ද වත්ත නැමැති ඉඩමට 1998.06.21 දින ඩබ්. ඩී. දසනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 3424 පිඹුර ප්‍රකාර ලොට් 12 ට මායිම්, උතුරට : ලොට් 9 ද, නැගෙනහිරට : ලොට් 11 ද, දකුණට : ලොට් 13 ද, බටහිරට : ලොට් 3 (පාර) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද, මාර්ග පරවශතාවය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 467/228 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

11-241

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1903300934.

ණයකරුගේ සම්පූර්ණ නම : ත්‍රිමන්ත හෙට්ටිගේ විකුම් නිශාන්ත පෙරේරා

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.10.31 වැනි දින අංක 1313 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.10.17 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මීගමුව, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, ප්‍රනාන්දු ඇවනියු, අංක 22 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් 2006.11.30 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්තුන්දහස් හාරසිය හැත්තෑහතරයි ශත අසූතුනක (රු. 53,474.83) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්හතර දහස් තුන්සිය තිස්පහක (රු. 34,335) මුදල ද, 2002.06.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහනව දහස් එකසිය තිස්නවයයි ශත අසූතුනක (රු. 19,139.83 ) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස්තුන්දහස් හාරසිය හැත්තෑහතරයි ශත අසූතුනක (රු.53,474.83) ද,

(2) එකී රුපියල් තිස්හතර දහස් තුන්සිය තිස්පහක (රු. 34,335) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළේ ඕතර පළාතේ, මාවතගම ගමේ පිහිටි බෝගහවත්ත නමැති ඉඩමට 1994.05.12 දින වයි. එම්. රංජිත් යාපා මානකතැන විසින් මැන සම්පාදිත අංක 3729 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2ට මායිම්, උතුරට : ජේ. එම්. පී. පීටර් පීරිස්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : ඉහත පිඹුරේ කැබලි අංක 3 ද, දකුණට : අඩි 10 ක් පළල පාරට වෙන් කර ඇති කොටස ද, බටහිරට : අඩි 12 ක් පළල පාරට වෙන් කර ඇති කොටසද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10)වූ ඉඩම මාර්ග පරවශතාවය ද සමග මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 49/229 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-242

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0502300018.

ණයකරුගේ සම්පූර්ණ නම : විජයවංශ කිත්සිරි බණ්ඩාරගේ ධර්මසිරි විජය බණ්ඩාර.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.01.28 වැනි දින අංක 1378 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.02.10 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මහනුවර, වටපුලුව, බෝමලුව පාර, අංක 83/5 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මහතා විසින් 2006.11.28 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස් දහස් එකසිය එකයි ශත විසිඑකක (රු. 1,30,101.21) මුදලක් වර්ෂ 2002.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑපන්දාහක (රු. 75,000) මුදල ද, 2002.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්පන් දහස් එකසිය එකයි ශත විසි එකක් (රු. 55,101.21) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් එකසිය එකයි ශත විසිඑකක් (රු. 1,30,101.21) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහසයි (රු. 75,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% හා 6% බැගින් වන පොලියක් 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මීගොඩ කෝරළේ මහගල්බඩ වැවුදවිල්ල හත්පත්තුවේ, මාරළු වාව පිහිටි ගොරකොටයාවත්ත, පරණගෙදරවත්ත සහ මැදවත්ත දැනට මැදවත්ත ලෙස හඳුන්වන ඉඩමට වර්ෂ 1996.10.15 දින එස්. ටී. ගුණසේකර මානකතැන සෑදූ 5839 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් 2 ඒ මායිම්, උතුරට : ඒ. එම්. අබේරත්නට අයිති ඉඩම සහ එස්. එච්. ටිකිරි බණ්ඩාරගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : ලොට් 2 බී සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මයිම් තුළ පිහිටි පර්චස් හතක් (අ. 0 රූ. 0 පර්. 7) විශාල බිම වේ. මෙය කැබලි 8 හි මාර්ග අයිතිය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1336/236 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

සාමාන්‍යාධිකාරී.

11-243

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2503300161 සහ 2500000789.

ණයකරුගේ සම්පූර්ණ නම : කුලසිංහ ආරච්චිගේ කරුණාසේන.

(මෙහි මින් මතු “එකී පනත” යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.09.29 වැනි දින අංක 1462 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.10.25 වැනි දින “ලක්බිම”, “ද අයිලන්ඩ්” සහ “තිනක්කුරල්” පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මහනුවර, වටපුලුව, බෝමලුව පාර, අංක 83/5 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මහතා විසින් 2006.11.29 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිහත්දහස් අටසිය පනස් නවයයි ශත දහනවයක (රු. 2,27,859.19) මුදලක් වර්ෂ 2004.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූ එක්දහස් හතලිහයි ශත විසිහතරක (රු. 1,81,040.24) මුදල ද, 2004.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් හයදහස් අටසිය දහඅටයි ශත අනූපහක් (රු. 46,818.95) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිහත්දහස් අටසිය පනස් නවයයි ශත දහ නමයක් (රු. 2,27,859.19) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් හතලිහයි ශත විසි හතරක (රු. 1,81,040.24) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2004.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මෙගොඩපොත පත්තුවේ, දෙහිගම්පල් කෝරළේ, යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ හතගොඩ ග්‍රාමයෙහි පිහිටි හිටිනාවත්තහි කොටසක් නමැති ඉඩමට 1995.11.27 දින එස්. අබේසිරිවර්ධන මානකතැන විසින් මැන සම්පාදිත අංක 2250 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම් උතුරට : පහළ කොටුව ද ; නැගෙනහිරට: හිටිනාවත්තහි කොටසක් ද ; දකුණට : තෙල්හිටියාව ග්‍රාමය ද ; බටහිරට: රිටිගහවත්ත ද යන මායිම් තුල පිහිටි පර්චස් දහහතරක (අක්. 00, රූඩ්. 0, පර්. 14) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමඟ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් 570/264 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

11-237

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900001688.

ණයකරුගේ සම්පූර්ණ නම : ජයසිංහ ආරච්චිගේ සුනිල් ජයසිංහ

(මෙහි මින් මතු “එකී පනත” යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.05.28 වැනි දින අංක 1343 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.07.23 වැනි දින “දිනමිණ” සහ “ද අයිලන්ඩ්”, “තිනක්කුරල්” පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මීගමුව, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, ප්‍රනාන්දු ඇවනියු, අංක 22 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මයා විසින් 2006.11.30 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්හත් දහස් දෙසිය දහයයි ශත හතලිහක (රු. 2,57,210.40) මුදලක් වර්ෂ 2002.06.30 වන දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූනවදහස් තුන්සිය පනස් එකයි ශත හතලිස් හතරයි

(රු. 1,89,351.44) මුදල ද, 2002.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටහත් දහස් අටසිය පනස් අටයි ශත අනූහයයි (රු. 67,858.96) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්හත් දහස් දෙසිය දහයයි ශත හතලිහයි (රු. 2,57,210.40) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූනවදහස් තුන්සිය පනස් එකයි ශත හතලිස් හතරයි (රු. 1,89,351.44) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.23% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

උපලේඛනය

උතුරු බස්නාහිර පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, අනයිවිලුන්දන් පත්තුවේ පිටිගල් කෝරළේ උතුර, ආරච්චිකට්ටුවේ ප්‍රාදේශීය සභා සීමාවේ වැවතලාකැලේ ග්‍රාමයේ පිහිටි වැවතලාකැලේ නමැති ඉඩමට 1996.10.11 දින ඒ. පී. එස්. බී. පරාක්‍රම මානක තැන විසින් සම්පාදිත අංක 1477 බී දරන පිඹුර ප්‍රකාර ලොට් 1 ඒ දරන කොටසට මායිම්, උතුරට : අන්දනාන්කට්ටුව සිට ප්‍රධාන පාර තෙක් දිවෙන පාර, නැගෙනහිරට : ආර්. ඒ. අබේකෝන්ගේ ඉඩම, දකුණට : ඉහත පිඹුරේ 1 බී දරන කොටස, බටහිරට : පාර සඳහා වෙන්කළ බිම යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවයද සමග හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආජ් 31/93 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-244

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000277

ණයකරුගේ සම්පූර්ණ නම : රේනදගේ සෑම් උපාලි හේමචන්ද්‍ර.

(මෙහි මින් මතු "එකී පනත " යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2003.08.01 වන දින අංක 1300 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.08.06 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ කුරුණෑගල. කුමාරතුංග මාවත, නව කාර්යාල සංකීර්ණය. අංක 28 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2006.11.27 වන දින පෙ.ව.10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී අංක 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැදුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිහත්දහස් නවසිය හතලිස් හතරයි ශත හැට හතයි (රු.227,944.67) මුදලක් වර්ෂ 2002.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ, උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ නවදහස් අටසිය අසූපහයි (රු.109,885.00) මුදලද 2002.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ දහ අට දහස් පනස් නවයයි ශත හැට හතයි(රු.118,059.67) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිහත්දහස් නවසිය හතලිස් හතරයි ශත හැට හතයි (රු.227,944.67) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ නවදහස් අටසිය අසූපහයි (රු.109,885.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහාද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහගල්බොඩ මෙගොඩ කෝරළේ වැඋඩවිල්ලි හත්පත්තුවේ මරළුවාවෙහි පිහිටි ගොරකොටයාවත්ත පරණගෙදරවත්ත හා මැදවත්ත දැනට මැදවත්ත නැමැති ඉඩම 1996.10.15 දින එස්. ටී. ගුණසේකර මානකවරයා විසින් අදින ලද අංක 5839 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි 6 දරන ඉඩමට මායිම් උතුරට :එස්. එම්. ටිකිරි බණ්ඩාට අයත් ඉඩමද ; නැගෙනහිරට : කැබලි 7 ද ; දකුණට: කැබලි 8 ද ; (අඩි 15 පලල පාර) බස්නාහිරට : කැබලි 3 ද යන මායිම් තුල පිහිටි පර්චස් දහයක් (අක්. 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුතු ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1336/217 හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින,

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-238

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - පුත්තලම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ඉක්බාල් විසින් සහතික කරන ලද්දාවූද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූද 2004.10.12 සහ අංක 23283 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙයියදු මොහොමඩ් මොහොමඩ් ෆියාස් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේදී 2006 නොවැම්බර් මස 30 වන දින පෙ.ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය කොට්ඨාසයේ, උතුරු අක්කර පත්තුවේ, තිහාලියේ පිහිටි සින්න තොටම් සහ විදාදි තොටම් නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ජේ. ඒ. වී. රාජනායගම් විසින් මැන සාදන ලද 2004.06.12 දිනැති අංක 4302 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 ලෙස නිරූපිත ඉඩම් කොටස වේ. විශාලත්වය අ. 0, රූ. 1,පර්. 2 යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.09.22 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.09.26 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු.500) ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු.2000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පුත්තලම ශාඛාව (දු. අංක. 032-2265582032-2265581) හෝ කොළඹ 10. ටී. බී. ජායා මාවත අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) දුරකථන අංක 2661815 2661816 ගෙන් ලබා ගත හැක.

එන්. එච්. පී. ආරියරත්න,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

එන්. එච්. පී. ආරියරත්න,
අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

12-236

## ඩී එෆ්. සී. සී බැංකුව

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මුල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි

### 2642 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ විස්තර

වයඹ පළාත, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවාමැදි හත්පත්තු කෝරළේ, ගිරිතලාන තේකම ග්‍රාමයේ පිහිටි "කෝන්ගහමුලහේන" සහ "කීනගස්පිටියවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු ඉරන්දතිස්ස කෝට්ටම්බගේ මහතා විසින් සහතික කරන ලද ලොට් 2004 ජූනි 18 දින හා ප්ලෑන් අංක 7683 දරන ඇපකරය යටතේ ගෙවීම් සිදු වී නොමැත. ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 01 සහ 02 යනුවෙන් නිරූපිත ඉඩම් කොටස ඉඩම ප්‍රමාණයෙන් අ. 3, රූ. 3, පර්චස් 4 එහි පිහිටි ගස්කොළන්, වැව්ලි, ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සමග හෙට්ටිපොළ පදිංචි රත්නායක මුදියන්සේලාගේ දයා ශ්‍රියානි හට අයිති කේවල ව්‍යාපාරය, "සිසිර එන්ටර්ප්‍රයිසස්" හෙට්ටිපොල ලියාපදිංචි කාර්යාලය විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද ණය අංක. 2642 දරන 2004 දෙසැම්බර් 8 වන දින කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තැව මහතා විසින් සහතික කරන ලදී. 2006 නොවැම්බර් මස 29 වන බදාදා පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි),
4. රු.22,000.00 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 යි,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 යි.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද, සමග අදාළ පරිදි වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න.

දුරකථන අංක : 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24,
ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන : 081-2227593.
දුරකථන/ෆැක්ස් : 081-2224371.

*නගර කාර්යාලය* :
අංක 290,
හැව්ලොක් වීදිය,
කොළඹ 05.
දුරකථන : 2585408, 2502680.
දුරකථන/ෆැක්ස් : 2588176.
ඊ මේල් : samera@sri.lanka.net

11-205

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900001168.

ණයකරුගේ සම්පූර්ණ නම : වස්තුහීන්දෙණිය ගෙදර පද්මිණී දිසානායක මැණිකේ

(මෙහි මින් මතු "එකී පනත " යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2002.10.25 වන දින අංක 1260 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.10.25 වන දින දිනමිණ, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ කුරුණෑගල, කුමාරතුංග මාවත, නව කාර්යාල සංකීර්ණය, අංක 28 යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2006.11.27 වන දින ප.ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස් එක්දහස් දෙසිය හතලිස් පහයි ශත හතලිස් නමයයි (රු.141,245.49) මුදලක් වර්ෂ 2002.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූඅටදහස් හත්සිය තිස් එකයි ශත අසූහතරක (රු.88,731.84) මුදලද 2002.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්දෙදහස් පන්සිය දහතුනයි ශත හැට පහයි (රු.52,513.65) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස් එක්දහස් දෙසිය හතලිස් පහයි ශත හතලිස් නවයයි (රු.141,245.49) ද,

(2) එකී රුපියල් අසූ අට දහස් හත්සිය තිස් එකයි ශත අසූ හතරයි (රු. 88,731.84) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහාද

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ දකුණු කටුගම්පොළ කෝරළේ කටුගම්පොළ හත්පත්තුවේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දණ්ඩගමුවෙහි පිහිටි මෝල්වත්ත නැමැති ඉඩමට ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු මානකරුවා විසින් 1997.09.10 දින මැන සාදන ලද 2117 දරන පිඹුර ප්‍රකාර ලොට් 3 දරන ඉඩමට මායිම් උතුරු නැගෙනහිරට : ලොට් 2 දරන පාරද ; දකුණු -නැගෙනහිරට : ලොට් 2 දරන පාර ද ; දකුණු -බටහිරට : ලොට් 1 සහ ලොට් 4 ද ; උතුරු -බස්නාහිරට ලොට් 2 ද යන මායිම් තුළ පිහිටා ඇති පර්චස් දොළහයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 12.20) වපසරියකින් යුක්ත ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතවායද සමග කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ කේ. 141/40 හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දීය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

11-239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.